# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2078/22 - 2018 ජූලි මස 03 වැනි අඟහරුවාදා - 2018.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 15/2014

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 66 වන සහ 69 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 117 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 ජුනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2018 අංක 12 දරන සිවිල් ගුවන් සේවා (සේවක පිරිස් සහ පුහුණු කිරීමේ ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ-ජනරාල්වරයා'' යනුවෙන් හඳුන්වනු ලබන) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මෙහි උපලේඛනයේ I තීරුවේ නිශ්චිතව සඳහන් කර ඇති යම් කාර්යයක් සම්බන්ධයෙන් යම් පුහුණු කිරීමේ පාඨමාලාවක් සැපයීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් සඳහා යම් තැනැත්තකු හෝ යම් ආයතනයක් විසින් මෙහි උපලේඛනයේ IV වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති සහ අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් හි ද නිශ්චිතව ද දක්වා ඇති අවශ්‍යතා සපුරා ඇති බවට සෑහීමට පත් වීමේ දී, අදාළ බලපත්‍රය හෝ අවසරපත්‍රය නිකුත් කිරීම හෝ ඒ සම්බන්ධයෙන් හේතු දක්වා බලපත්‍රය හෝ අවසරපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබිය හැකි ය. අවස්ථාවෝචිත පරිදි, අදාළ බලපත්‍රයේ හෝ අවසරපත්‍රයේ කාණ්ඩය මෙහි උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති අතර උපලේඛනයේ IV වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති සඳහා මාර්ගෝපදේශ එහි III වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති අත්පොත්වල සඳහන් පරිදි විය යුතු ය.

3. අවස්ථාවෝචිත පරිදි, 2 වන නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් නිකුත් කිරීම, සංශෝධනය කිරීම, අලුත් කිරීම, අත්හිටුවීම සහ අවලංගු කිරීම සඳහා වන කාර්යපටිපාටිය, එවැනි යම් බලපත්‍රයකට හෝ අවසර පත්‍රයකට අදාළ නියම සහ කොන්දේසි සහ ඊට අනුබද්ධිත වරප්‍රසාද, උපලේඛනයේ IV වන තීරුවේ නිශ්චිතව දක්වන ලද හා 2011 ජූලි මස 5 වන දිනැති සහ අංක 1713/7 අංක දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, එවැනි එක් එක් කාර්යය සඳහා වන අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඉල්ලුම්පත්‍රය සකස් කිරීමේ ගාස්තු, බලපත්‍ර හෝ අවසරපත්‍ර ගාස්තු සහ එහි යම් අලුත් කිරීමක් සඳහා වන ගාස්තු 2014 ජූලි මස 2 වන දිනැති සහ අංක 1869/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2014 අංක 1 දරන සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගාස්තු සහ අයකිරීම් නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

5. සෑම බලපත්‍ර දරන්නෙක් විසින් ම, අවස්ථාවෝචිත පරිදි, 2 වන නියෝගය යටතේ නිකුත් කරන ලද අදාළ බලපත්‍රය හෝ අවසරපත්‍රය කල් ඉකුත්වීමේ දිනයට පෙරාතුව, අදාළ බලපත්‍රය හෝ අවසර පත්‍රය අලුත් කිරීම සඳහා අධ්‍යක්ෂ - ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

6. මෙම නියෝග යටතේ බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකු හෝ ආයතනයක් විසින් ගුවන් සේවා නිරුපද්‍රිතතා නියම සම්බන්ධයෙන් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක යම් විධිවිධානයක් කඩකර ඇති බවට ඔප්පු වීමෙන් පසුව, අධ්‍යක්ෂ - ජනරාල්වරා විසින්, අවස්ථාවෝචිත පරිදි, එම බලපත්‍රය හෝ අවසරපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

7. අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් මෙම නියෝග යටතේ ගනු ලැබූ තීරණයක් මගින් අගතියට පත් වන යම් තැනැත්තකු හෝ ආයතනයක්, අදාළ තීරණය එම තැනැත්තාට හෝ ආයතනයට ලැබුණු දිනයේ සිට වැඩ කරන දින තිහක් ඉකුත් වීමට පෙර, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 112 වන වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වන්නේ ය.

8. 1955.07.01 වන දිනැති අංක 10812 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1955 ගුවන් සංතරණ නියෝගයන් හි ඇතුළත් පහත සඳහන් නියෝග, ඒ යටතේ පූර්වයෙන් සිදු කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් ඉවත් කරනු ලැබේ :-

(*අ*) (IV) වන පරිච්ඡේදයේ 22 වන නියෝගයේ සිට 30 වන නියෝගය දක්වා ;

(*ආ*) (V) වන පරිච්ඡේදයේ 48 වන නියෝගයේ සිට 73 වන නියෝගය දක්වා ; සහ

(*ඇ*) (VI) වන පරිච්ඡේදයේ 74 වන නියෝගයේ සිට 80 වන නියෝගය දක්වා.

9. මේ නියෝගවල කාර්ය සඳහා -

''සම්මුතිය'' යන්නට 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත යටතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

''අධ්‍යක්ෂ-ජනරාල්වරයා'' යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ.

*උපලේඛනය*

| *I වන තීරුව*<br>*කාර්යය* | *II වන තීරුව*<br>*බලපත්‍ර කාණ්ඩය* | *III වන තීරුව*<br>*අත්පොත/අත්පොත්* | *IV වන තීරුව*<br>*ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති* |
|---|---|---|---|
| පියාසර කිරීම | (අ) ශිෂ්‍ය නියමු බලපත්‍රය<br>(ආ) පෞද්ගලික නියමුවා - අහස් යානය, ගුවන් නැව, හෙලිකොප්ටරය හෝ බලය ආරෝපිත යානය<br>(ඇ) වාණිජ නියමුවා-අහස් යානය, ගුවන් නැව, හෙලිකොප්ටරය හෝ බලය ආරෝපිත යානය<br>(ඈ) බහු මගී නියමුවා - අහස් යානය<br>(ඉ) ගුවන් ප්‍රවාහන සමාගමක ප්‍රවාහන නියමුවා - අහස් යානය, ගුවන් නැව, හෙලිකොප්ටරය හෝ බලය ආරෝපිත යානය<br>(ඊ) ග්ලයිඩර් නියමුවා<br>(උ) නිදහස් බැලූන් නියමුවා<br>(ඌ) පියාසර යාත්‍රිකයා<br>(එ) පියාසර ඉංජිනේරුවා | SLCAP 3010<br>SLCAP 3030<br>SLCAP 3040<br>SLCAP 3050<br>SLCAP 3080<br>SLCAP 3090 | IS 50<br>IS 08<br>IS 43<br>IS 51<br>IS 72<br>IS 67<br>IS 76<br>IS 69<br>IS 71 |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරුව* *කාර්යය* | *II වන තීරුව* *බලපත්‍ර කාණ්ඩය* | *III වන තීරුව* *අත්පොත/අත්පොත්* | *IV වන තීරුව* *ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති* |
|---|---|---|---|
| ගුවන් යානා සැලසුම්කරණය, නිෂ්පාදනය, නඩත්තු කිරීම සහ ඉංජිනේරු ශිල්පය. | ගුවන් යානා නඩත්තු කිරීම (තාක්ෂණ ශිල්පියා/ ඉංජිනේරුවා/කාර්මික ශිල්පියා) | SLCAP 3010<br>SLCAP 3030<br>SLCAP 3070 | IS 66<br>IS 145<br>IS 147<br>IS 50 |
| ගුවන් ගමන් පාලනය | ගුවන් ගමන් පාලකවරයා | SLCAP 3010<br>SLCAP 3030<br>SLCAP 3040<br>SLCAP 3060 | IS 50<br>IS 55 |
| පියාසර මෙහෙයුම් | පියාසර මෙහෙයුම් නිලධරයා/ පියාසර පිටත් කරන්නා, මැදිරි කාර්ය මණ්ඩල සාමාජිකයා | SLCAP 3010<br>SLCAP 3030<br>SLCAP 3100 | IS 49<br>IS 50 |
| ගගන නාවික ස්ථානයේ මෙහෙයුම් | ගගන නාවික ස්ථාන මෙහෙයුම්කරු | SLCAP 3010<br>SLCAP 3030<br>SLCAP 3040<br>SLCAP 3100 | IS 48<br>IS 50 |
| වෛද්‍ය | පියාසර කිරීම/ගුවන් පාලනය සඳහා වන වෛද්‍ය අවශ්‍යතා | SLCAP 3020 | IS 36 |
| ගුවන් සේවා පුහුණු කිරීමේ කාර්යයන් | ගුවන් සේවා පුහුණු කිරීමේ ආයතනය පිහිටුවීම සඳහා බලපත්‍රය හෝ අවසර පත්‍රය | SLCAP 3090<br>SLCAP 3070<br>SLCAP 3060<br>SLCAP 3100 | IS 67<br>IS 147<br>IS 50 |
| සාමාන්‍ය | සියලු බලපත්‍ර අදාළ වර්ගීකරණය, ප්‍රවීණතා සහතිකය හෝ අවසර පත්‍රය | | IS 68<br>IS 35 |

07 - 540

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.